## අඟහරුවාදා

පළමුවන කියැවීම ප්‍රඥා 2: 23 – 3: 9

සලමොන්ගේ ප්‍රඥාව පොතෙන් ගත් පාඨයෙකි.

"අඥාවණයන්ගේ ඇස් ඉදිරියෙහි ඔවුන්ගේ මරන විපත්තියක් මෙන් පෙනුණි.
එහෙත් ඔව්හු සමාදානයෙන් සිටිති."

එහෙත්, දෙවිඳාණෝ මිනිසා නොමැරෙනසුලු කෙනෙකු කළ සේක. සිය ස්වරූපයට ඔහු මවා වදාළ සේක. ලොවට මරණය පැමිණියේ යක්ෂයාගේ ඊර්ෂ්‍යාවෙනි. ඔහුගේ හවුල්කාරයන් ද මෙය සොයාගනු ඇත. සුදනන්ගේ ජීවිත දෙවිඳුන්ගේ රැකවරණයෙහි ය. කිසිම හිංසාවක් කිසිදාක ඔවුන්ට නොපැමිණෙනු ඇත. අනුවණයන්ගේ ඇස් ඉදිරියෙහි ඔවුහු මිය යන්නාක් මෙන් වූහ. ඔවුන්ගේ මරණය විපත්තියක් මෙන් පෙනුණි.

ඔවුන් අප අත් හැර යාම නැත්තට ම නැති වීමක් මෙන් විය. එහෙත් ඔව්හු සමාදානයෙන් සිටිති. ඔවුන් දඬුවම් ලැබුවන් සේ මිනිසුන්ට පෙණුන නමුත් ඔවුන්ගේ බලාපොරොත්තුව අමරණීය භාවයෙන් පෝෂණය විය. ඔවුන්ගේ වේදනාව අල්ප විය. ඔවුන් ලබන ආසිරි විශාල වනු ඇත. තමන් සමග සිටීමට ඔවුන් සුදුසු බව පෙනී ගියේ ය. එතුමාණෝ උදුනේ රත්රන් මෙන් ඔවුන් පරීක්ෂා කළ සේක.

දවන යාග පූජාවක් මෙන් ඔවුන් පිළිගත් සේක. විනිශ්චය කාලය පැමිණෙන විට ඔව්හු බබළන්නෝ ය. ඉපනැලි අතර ගිනි පුපුරු මෙන් දිළිසෙන්නෝ ය. ඔව්හු ජාතීන් විනිශ්චය කරන්නෝ ය. සමිඳාණෝ සදහට ම ඔවුන්ගේ රජ වන සේක. දෙවිඳුන් කෙරෙහි විශ්වාස කරන්නෝ සත්‍යය තේරුම් ගන්නෝ ය. සැදැහැවත්හු එතුමන් සමග ප්‍රේමයෙන් ජීවත් වන්නෝ ය. එතුමන් තෝරා ගත් අය වරප්‍රසාදය හා දයාව එන තෙක් බලා සිටින්නෝ ය.

දේව වචනය මෙසේ ය.

පිළිතුරු ගීය ගීතාවලිය 34: 1–2, 15–18

පිළිතුර : සමිඳුන්ට සැම විට ම මම ප්‍රශස්ති ගී ගයමි.

ගීය :

හැම වේලේම හිමිතුමන්ට මම ප්‍රශස්ති ගී ගයමි.
එතුමන්ගේ ගුණ වැනුම් මා මුවින් තොර නොවෙයි.
මම එතුමන්ගේ ගුණ වර්ණනා කරමි.
නිහතමානි අය ඒ අසා සතුටු වෙත්වා!

හිමි තුමන්ගේ දෙනෙත දැහැමියන් දෙසට ද
එතුමන්ගේ දෙසවන ඔවුන්ගේ කන්නලව්වට ද යොමා ඇත.
පව්කම් කරන අය පොළොවෙන් අමනක වී යන ලෙස
හිමිතුමාණෝ ඔවුන්ට විරෝධය දක්වන සේක.

දැහැමි අය අයැදුම් කළහ. හිමිතුමාණෝ සවන් දී,
සියලු දුක් වේදනාවෙන් ඔවුන් මිදූ සේක.
හිමිතුමාණෝ බිඳුණු සිත් ඇත්තන්ට ළංව සිටින සේක.
තැළුණු හදවත් ඇත්තන්ට පිහිට වන සේක.

<u>සුපුවත් ජය නද</u> මතෙව් 4: 4

ආලේලූයා! ආලේලූයා!
"මිනිසා ජීවත් වන්නේ කෑමෙන් පමණක් නොව
දෙවියන් වහන්සේගේ මුවින් නික්මෙන වචන වලින් ය" යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

නොහොත්

<u>සුපුවත් ජය නද</u> ජුවාම් 14: 23

ආලේලූයා! ආලේලූයා!
'යමෙක් මට ප්‍රේම කරන්නේ නම්, හෙතෙම මාගේ ධර්මය පිළිපදින්නේ ය.
මාගේ පියාණන් වහන්සේ ද ඔහුට ප්‍රේම කරන සේකැ' යි
සමිඳාණෝ වදාරන සේක.
ආලේලූයා!

<u>සුවිශේෂය</u> ලූක් 17: 7-10

ලූක් තුමාගේ ශුද්ධවූ සුවිශේෂයෙන් උපුටා ගත් කොටසකි.

"අපි දාසයෝ ය. කළ යුතු දෙය පමණක් අපි කෙළෙමු."

"ඔබ අතරෙන් යමෙකුට සීසාන හෝ බැටළුවන් බලන හෝ දාසයෙක් සිටී නම්, කෙතේ සිට ආ කල 'වහාම ඇවිත් කෑමට හිඳ ගන්න යැ' යි කියන්නෙහි ද? එසේ නොව 'මට කෑම බීම පිළියෙළ කොට, ඇඳගෙන ලෑස්ති වී කා බී නිම වනතුරු මට උපස්ථාන කරන්න. ඉන්පසු ඔබ කන්න බොන්නැ' යි කියන්නේ නැද්ද?

ඒ දාසයා තමාට අණ කළ දේ කළ බැවින් ස්වාමියා ඔහුට ස්තුති කරයිද? නැත. එසේම ඔබත් ඔබට අණ කළ සියල්ල කළ පසු, 'අපි දාසයෝ ය, ස්තුතියක් අපට හිමි නැත. කළ යුතු දෙය පමණක් අපි කෙළෙමු' යි කියන්නැ" යි ස්වාමින් වහන්සේ වදාළ සේක.

සමිඳාණන් වහන්සේගේ සුභාරංචිය මෙසේ ය.